# නාථ දේව වන්දනයේ ජනතා අපේක්ෂා

## අජිත් තල්වත්ත

බෞද්ධ ජන සමාජයෙහි තිබඳ ව ගෞරවාදරයට ලක්වන දෙවියකු ලෙස නාථ දෙවියන් සැලකිය හැකිය. බුදුරජාණන් වහන්සේ වදාළ ධර්මයට අනුව, නිර්වාණය මගින් සසර ගමන කෙළවර වී අවසාන විමුක්තිය ලද හැකි වුවත්, දෙවියන් සරණ යෑම එතරම් ම දුරට පිළිගන්නේ නැති බවක් පෙනේ. එනමුත් කාලානුරූප ව සිදු වූ වෙනස්වීම් තුළ බෞද්ධ චරියාවන් තුළ දෙවියන් සම්බන්ධ ක්‍රියා පිළිවෙත් සම්මිශ්‍ර වී ඇත. බෞද්ධ සංකල්පය හා දේව සංකල්පය එකිනෙකට බද්ධ වීම පොළොන්නරු යුගයෙන් පසු සෘජු වශයෙන් සිදුවිය. එලෙස මුසු වී ජනතා ගෞරවාදරයට පත් දෙවි කෙනකු ලෙස නාථ දෙවියන් සැලකිය හැකිය.[1] මෙරට ඉතිහාසයේ නාථ දෙවියන් වඩාත්, වැදගත් වන්නේ බෝධිසත්ව තත්ත්වයේ සිට ක්‍රමික ව දේවත්වයට පත්වීම නිසාය. මුල දී අවලෝකිතේශ්වර බෝධිසත්වයන් ලෙස පුද පූජා ලැබූ මෙම දෙවියන් පසුකාලීනව බෝධිත්ව තත්ත්වයෙන් මිදී දේවත්වය ආරෝපණය කරගන්නා ආකාරය දක්නට ලැබේ.[2] අස්ගිරි මහා විහාරයේ දළදා තේවා කටයුතු හා සම්බන්ධවීමේ දී මහනුවර නාථ දේවාලය හා ආශ්‍රිත කටයුතු සඳහා ද විශේෂ වැදගත්කමක් ලැබී ඇත. මෙම නාථ දේවාය පිහිටි විහාරස්ථානය ද අයත් වන්නේ අස්ගිරි විහාර පාර්ශවයට ය.

පොළොන්නරු යුගයෙන් පසුව එන 14 වන සියවස සිංහල ඉතිහාසයේ දේශපාලන හා ආර්ථිකයේ පසුගාමී යුගයකි.[3] පුලස්තිපුරය දහතුන් වන සියවස අග භාගයේ දී අතහැර ආරක්ෂක උපායක් වශයෙන් රජධානි නිරිතදිගට සංක්‍රමණය වීම ඇරඹුණි. නමුත් අනුරාධපුර යුගයේ සිටම ජනප්‍රිය ව පැවති මහායාන බෝධිසත්ත්ව සංකල්පය 14 වන සියවස වන තෙක්ම සිංහල සමාජ, දේශපාලන ව්‍යුහයක් තුළට සුවිශේෂී වූ බව නොපෙනේ. මෙම බෝධිසත්ත්වයන් දේශීය බවට පත්වීම සිදුව ඇත්තේ ගම්පොළ යුගයේ දී වන අතර එතැන් සිට අවලෝකිතේශ්වර ස්වීයත්වය හා අනන්‍යතාව ද සැකසීමට භාජනය විය.[4] අවලෝකිතේශ්වර නාථ නමින් ආරම්භ වී ඇත්තේ 14 වන සියවසේ ගම්පොළ යුගයේ දී බවට සාධක ඇත. ඔහුගේ තවත් අභිදානයක් වන "ලෝකේශ්වර නාථ" යන්නෙහි කෙටි නම වන නාථ යන නමිනි. ලෝකේශ්වර නමින් අදහස් වනුයේ "ලොවම ඉසුරුමතා නැතිනම් ලොවට අධිපතියා" යන්නයි. මේ අනුව විවිධාකාරයෙන් සකලවිධ සත්වයාට ම පිහිටවීමේ ශක්තිය ඇති උතුමෙකු ලෙස නාථ හෙවත් අවලෝකිතේශ්වර නාථ හඳුන්වා ඇති බව පෙනේ.

මෙම හැඳින්වීම නිසා බෝධිසත්වයන්ගේ අතීතය මුළුමනින් ම මැකී ගියද උඩරට රාජධානියේ දේශපාලන උරුමය තහවුරුවට සම්බන්ධ වී ලෞකික දෙවියකු බවට පත් විය.

පොළොන්නරු යුගයෙන් පසු මෙරට ඇති වූ දේශපාලන සහ සාමාජික අස්ථාවරත්වය හේතු කොට ගෙන දේව ඇදහීම කෙරෙහි ජනතාව වඩාත් නැඹුරු වූ බව පෙනේ. තවද ශ්‍රී ලාංකේය දේශපාලන බලය සුන්බුන් වීමට අමතර ව සිදු වූ තවත් සුවිශේෂි දෙයක් වන්නේ සෑම ස්තරයකට ම බලපාන අයුරින් පෙර නොපැවති තරම් සංස්කෘතික අනුකලනයක් ඇති වීමයි. ඒ සමඟ ම හින්දු හා මහායානික සංකල්ප රාශියක් සම්මිශ්‍රණය වීම සිදු විය. එසේ ම මහායාන අවලෝකිතේශ්වර බෝධිසත්වයන් ශ්‍රී ලාංකීය දෙවි කෙනෙකු වශයෙන් සලකා නාථ දෙවියන් බවට පරිවර්තනය වීමත් සිදු වේ. 15 වන සියවස වන විට

නාථ දෙවිඳුන් ඇදහීම ශ්‍රී ලංකාවේ ඉතා සුලභ දෙයක් වී ඇත.[5] සමස්තයක් වශයෙන් බැලිමේ දී ගම්පොළ යුගය දේශපාලන වශයෙන් යම් අවස්ථාවරත්වයක් නිරූපණය කළත් සංස්කෘතික වෙනස්වීම් හා හැඩගැසීම් බෙහෙවින් සිදු වූ යුගයක් වශයෙන් හඳුනාගත හැකිය. ගම්පොළ යුගයේ දී බෝධිසත්ව වන්දනය බෙහෙවින් ජනප්‍රිය ව පැවති බවක් දක්නට ලැබේ. මෙය එකවර ඇති වූවක් නොව ක්‍රමික ව විකාශනය වූවකි. දඹදෙණි යුගයේ දෙවන පැරකුම් රජු බුදු බව ප්‍රාර්ථනා කරවීමට දේවපතිරාජ අගමැතිවරයාගේ ආරාධනාවෙන් බුද්ධ පුත්‍ර හිමයෝ පූජාවලිය රචනා කළහ.[6] මෙම යුගයේ දී මහා දුර්භික්ෂයක් ඇති වූ විට රජවරුන් "තුනුරුවන්, චෛත්‍ය, බෝධීන්ට ද මහාර්ධි හැකි නාථ, මෛත්‍රෙය දේවාද පිදිය යුතු දෙවියන්ට පූජා පවත්වා[7]" වර්ෂාව ප්‍රාර්ථනා කර ඇත. මෙම රජතුමාගේ සහෝදරයා වූ විජයබාහු 'බෝසත් ' විජයබාහු ලෙස හඳුන්වා තිබේ.

බෝධිසත්ව වන්දනය හා බුද්ධත්වය ප්‍රාර්ථනා කිරීම ගම්පොළ යුගයේ ශිලා ලේඛනවල සහ සාහිත්‍ය මූලාශවල ද දක්නට ලැබේ. මෙම යුගයේ විහාරස්ථානවල දේව රූප සමඟ ම බෝධිසත්ව රූප ද කරවා ඇත. ජාතක පොතේ ඇති කථා ගම්පොළ යුගයේ විහාරවල සිතුවම් කරන ලදී.[8] ගඩලාදෙණි ලිපියේ නාථ සහ මෛත්‍රී දෙදෙනා ගැන දැක්වේ. නාථ යනු මෙම දෙවියන්ගේ දකුණු ඉන්දියානු නාමය බවට මහාචාර්ය මංගල ඉලංගසිංහ විසින් පෙන්වා දෙනු ලැබේ.[9] මෙම බෝධිසත්වවරුන් පොදුවේ දෙවියන් අතර දක්වා ඇතත් බෝධිසත්වවරුන් ලෙස ඔවුන්ට හිමි වූ ස්ථානය මෙම අවධියේ වෙනත් මූලාශ්‍රවල ද දැකගත හැකිය. ලංකාතිලක සිංහල ලිපියේ මෛත්‍රී බෝධිසත්ව නමින් ද නාථ ලෝකේශ්වර නාථ නමින් ද හඳුන්වා ඇත. මින් අවබෝධ වන්නේ සෙසු දෙවියන්ට වඩා නාථ දෙවිඳුන්ට විශේෂත්වයක් මෙම යුගයේ දී හිමි වූ බවයි.

නියම්ගම්පාය ලිපියට අනුව එම විහාරයේ උඩු වියනේ මෛත්‍රී බෝසතුන්ගේ රුව සිතුවමට නැගු බව පෙනේ.

සෙංකඩගල දෙවියන් විසින් අලකේශ්වර දේවමන්ත්‍රීශ්වර දෙදෙනාට සිහිනයෙන් පෙනී සිට සතුරන් පරාජය කිරීම පිණිස ජය කාරණා දක්වන ලද බවට සගම ලිපිය සාක්ෂි දරයි.[10] නාථ බෝධිසත්වයකුට වඩා ලංකාරක්ෂක දෙවියකු ලෙස ක්‍රියාත්මක වූ බව පෙනේ. නාථ දෙවියන් සම්බන්ධයෙන් ජෝන් ක්ලිෆර්ඩ් හෝල්ට් දක්වන අදහස ඉතා වැදගත් වේ "නාථ සහ මෙරට රාජත්වය අතර සුවිශේෂි සබඳතාවන් පැවති බවත් මෙරට පාලකයන් බෝධිසත්ව යානය අනුගමනය කළ බවත්, ඒ අනුව බෝධිසත්ව, දේව, රජ යන සංකල්පයක් පැවති බවත්, ඒ නිසා නාථ සිංහල රාජ්‍යයේ ආරක්ෂකයා[11] බවත් පවසයි. එසේ ම අම්පිටිය ලිපියේ[12] දැක්වෙන "සෙංකඩගල දෙවියන්" යනු ද මෙම නාථ දෙවියන්ම බව ඔහුගේ අදහසයි. මේ වනවිට නාථ කෘත්‍යමය වශයෙන් දෙවියකු බවට පත් වී සිටි බව ද, සත්වයන් සසරින් එතර කිරීමේ බෝධිසත්ව ගුණය වෙනුවට බැතිමතුන් ආරක්‍ෂා කරන ලෞකික කාර්යයන් ඉටු කළ දෙවියකු බවට පත් වූ බව ද හෝල්ට් වැඩිදුරටත් පෙන්වා දේ.

මුල දී බෝධිසත්වයකු ලෙස වන්දනයට පාත්‍ර වූ අවලෝකිතේශ්වර, දිව්‍යමය ලක්ෂණ ලබාගෙන ඇත්තේ වෛදික මූලාශ්‍රවලිනි. මහා බ්‍රාහ්මණයාගේ නිර්මාණ ශක්තිය, පුරුෂ ගුණාංගයන්, ලෝක නිර්මාණ ප්‍රජාපතිගේ ප්‍රජනනාත්මක ක්‍රියා ආදියත්, බ්‍රාහ්මණ සමාජයෙන් ගත් බෞද්ධයන් එකී සියල්ල අවලෝකිතේශ්වරට ආරෝපණය කර ඇත.[13] අධික ශක්තිය හා ගෞරවය නිසා ම සිංහල බෞද්ධ ජනතාවගේ නොමඳ පිදුමට ලක් වූ හෙතෙම, 14 වන සියවස වන විට ලෝකේශ්වර නාථ යන නමින් දේවත්වයට පත්වී සිටි බව අවබෝධ වේ.[14] ගම්පොළ යුගයේ දැදිගම රජ කළ පස්වන පරාක්‍රමබාහු රාජ්‍ය සමයේ ලියවුණු තිසර සංදේශයේ නාථ දෙවියන් නතිඳුන් නමින් ද එතුමාගේ දේවිය තාර බිසව යනුවෙන් ද[15] වර්ණනාවට බඳුන් ව ඇත.

නාථ දේව සංකල්පයේ ඓතිහාසික විකාශය පිළිබඳ ව අවධානය යොමු කිරීමේ දී කෝට්ටේ යුගය ද වැදගත් වේ. නාථ දෙවිඳුන් සම්බන්ධ දැඩි භක්තිවන්තයකු වූ තොටගමුවේ ශ්‍රී රාහුල හිමි නාථ දෙවිඳුන් පිළිබඳ විස්තර කරන්නේ සූර්යයාට හා චන්ද්‍රයාට සමකළ හැකි ලෙසිනි.[16] තවද ඔහු අනාගතයේ බුදු වන බව ප්‍රකාශ කරයි. එයින් පෙනී යන්නේ ශ්‍රී රාහුල තෙරුන් අවලෝකිතේශ්වර බෝධිසත්වයන් පිළිබඳ භක්ති වන්තයකු බවය. මහනුවර යුගයට අයත් ඇම්බැක්ක වර්ණනාවේ ද නාථ දෙවියන් ගැන සඳහන් කර ඇත. මෙම කරුණු අනුව අවබෝධ වන්නේ 15 වන ශත වර්ෂය වන විට නාථ දෙවිඳුන් ඇදහීම ශ්‍රී ලංකාවේ ඉතා ප්‍රචලිත දෙයක් වූ බවය.

නාථ දෙවියන් පසුකාලීන ව සිංහල රාජ්‍යත්වය හා සමීප සම්බන්ධතාවක් ඇති කර ගත් බව හෙළි වේ. විශේෂයෙන් ම මෙම පසුබිම මහනුවර යුගය වන විට ප්‍රබල වේ. සෙංකඩගල සමය වන විට නාථ ජාති ආරක්ෂක දෙවියකු වූ බව පෙනේ. සිංහල සිව්වරම් දෙවියන්ගේ කෙනෙකු බවට පත්වන නාථ පසුකාලීන ප්‍රධාන සංස්කෘතික මංගල්‍යයන්ට ද එකතු විය.[17] මෙතෙක් අවධානය යොමු කළ කරුණු විග්‍රහ කිරීමෙන් පෙනී යන්නේ අවලොකිතේශ්වර බෝධිසත්ව සංකල්පයේ ලෞකික ගුණාංග හේතුවෙන් නාථ සංකල්පයේ විකාශනය ඇරඹෙන බවකි. පසුව නාථ දෙවියන් ලෝකෝත්තර අරමුණු කෙරෙහි නැඹුරු වීමත් එමඟින් ඔහු නැවත බෝධිසත්වයකු බවටත් පත්වේ.

සගම හා අම්පිටිය සෙල්ලිපි මඟින් පෙන්නුම් කෙරෙන්නේ සෙංකඩගල නාථ දෙවියන් හා සිංහල රාජත්වය අතර සබඳතාවක් 14 වන සියවස වන විට ගොඩනැගී පැවති බවය. මහනුවර අවිධියෙහි පැවති අභිෂේක චාරිත්‍රවල දී විෂ්ණු හා නාථ දේවාල සඳහා ප්‍රධාන තැන හිමිවූ බව ප්‍රකට කරුණකි. එනමුත් අප මෙහි දී විශේෂ අවධානයට ලක්වන්නේ නාථ දෙවියන් සම්බන්ධයෙනි. නායක්කර් වංශිකයන් බලයට පත්වීමෙන් අනතුරුව ඍජු වශයෙන් නාථ දෙවිඳුන් හා සමාජය අතර සමීප බවක් ඇති වේ.

මහනුවර අවධිය වන විට රාජපදප්‍රාප්ත වීම හා සම්බන්ධ වැදගත් චාරිත්‍ර ගණනාවක් පැවතිණ. ඒ තුළ වඩා සුවිශේෂ වූයේ රජුට නමක් තේරීම හා මඟුල් කඩුව තේරීමේ චාරිත්‍රයයි. මෙම වැදගත් චාරිත්‍රය නාථ දේවාලය හා දේවාල භූමියේ බටහිර දෙසින් ගොඩනංවන ලද චෛත්‍යය අසළ ඉදිකරන ලද දර්ශනීය කවාකාර මණ්ඩපය තුළ සිදු කළ බව පෙනේ. රජුට සුදුසු නමක් තෝරා ගැනීමේ මංගල උත්සවය පැවැත්වූයේ මේ නාථ දේවාලයේ දී ය.[18] රාජකීය නක්ෂත්‍රාචාර්යවරුන් විසින් ලබාදුන් නම් කිහිපයක් තෝරා රන් පත්වල ලියා රිදී තැටියක තබා නාථ දේව ප්‍රතිමාව ඉදිරිපිට තබනු ලැබේ. අභිනවයෙන් රජකමට පත්වූ රජු නියමිත සුබ දිනයේ දී සේනාව සමඟ විෂ්ණු දේවාලයට ගොස් දෙවියන් පුදා නාථ දේවාලයට පැමිණ දේව පූජා පවත්වා ඇත. නාථ දෙවියන් ඉදිරියේ තැබූ රන්පත් පරීක්ෂා කොට තමන්ට අභිමත නාමයක් තෝරාගෙන පළමු ව ප්‍රධාන අදිකාරම්වරයාට කියන්නේ ය.[19] පසුව ඔහු සැමට ඇසෙන පරිදි "රජතුමන් සඳහා දෙවියන් තෝරා ගෙන ඇති නම මෙයයි." යනුවෙන් ප්‍රකාශ කරයි.[20] අනතුරු ව එකී නාමයට සහිත රන්පත රජුගේ නළලේ බැඳීමෙන් පසුව රන් අසිපත ලබාගැනීමේ චාරිත්‍රය සිදු කෙරේ. දේවාලයේ ප්‍රධාන කපුමහතා විසින් සකසා ගෙනෙන සඳුන් කල්කය මත අත තවරා රජතුමා අසිපත අල්ලනු ලැබේ. මේ චාරිත්‍රය විෂ්ණු දේවාලයේ දී මෙන්ම නාථ දේවාලයේ දී සිදු කරන්නේ ය.[21]මහනුවර යුගයේ පැරණි සම්ප්‍රදායන් පිළිපදින බැවිනුත්, ලංකාවේ සෑම රජ කෙනෙක් ම බෝධිසත්ව කෙනෙක් ය යන්න දහවෙනි සියවසේ අභයගිරි වාසී භික්ෂූන් විශ්වාස කළ බැවිනුත්, පසු කාලයේ ලංකාවේ රජවරුන්ට බෝධිසත්වාකාර යන උපපද නාමය යෙදූ බැවිනුත්, රජ්ජුරුවන් සිය රාජ නාමය හා මඟුල් කඩුව අවලෝකිතේශ්වර බෝධිසත්වයන් අතින් තැබීම ද පුරාණ සිරිතක් වූවා විය හැකිය.

ඉහත පසුබිම තුළින් පැහැදිලි වන්නේ උඩරට ජනප්‍රිය වූ නාථ වන්දනය වර්තමානය වන විට මහනුවර ප්‍රදේශයේ ව්‍යාප්තව පවතී. මෙම දේව වන්දනයේ වෘද්ධතම අවස්ථා ලෙස මහනුවර,

වේගිරිය, පස්ගම, හා දොඩම්වල යන ස්ථාන ඇසුරෙන් නාථ දේවාල ඉදිවීම කැපී පෙනේ. එලෙස දේවාල ඉදිකර ජනතාව අපේක්ෂා කළේ කුමක්ද ? යන්න වටහා ගැනීම ඉතා වැදගත් වේ.

නවීකරණය හා තාක්ෂණ ඥානය ශීඝ්‍රයෙන් වර්ධනය වන නූතන සමාජය තුළ ලෞකික අපෙක්ෂා මුදුන් පමුණුවා ගැනීමට විධිමත් හා අවිධිමත් උපක්‍රම ඉතා ප්‍රබලව යොදාගන්නා බව පැහැදිලි කරුණකි. මුල් අවධියේ යහපත් ප්‍රාර්ථනාවන්ගෙන් යුක්ත වූ එම ජීවිත අපේක්ෂා බුදුදහම හා ඍජුව බැඳී පැවති බව පැහැදිලි වේ. එම ජන සමාජයේ සතරවරම් දෙවිවරුන් ප්‍රධාන වූ දේව සමූහයට ප්‍රමුඛ ස්ථානයක් හිමිව තිබුයේ පොදු ජනතාවගේ යහපත් ප්‍රාර්ථනා ඉටුකර ගැනීමට ය. නමුත් පසු කාලයේ යහපත් මෙන් ම අයහපත් ප්‍රාර්ථනාවන් සඳහා ද ඔවුන් දෙවියන්ගේ පිහිට අපේක්ෂා කර ඇත. බෞද්ධාගමික සංකල්ප හා බැඳි දේව විශ්වාස මගින් ඒවා ඉටු කර ගැනීමට නොහැකි වූ කල්හි වෙනත් දේව සංකල්ප නිර්මාණය කර ගැනීමට ඔවුහු පෙළඹුණහ. එසේ පිහිට අපේක්ෂාවෙන් ජනතාව අතර ප්‍රචලිත වූ දේව සංකල්පයක් ලෙස නාථ දෙවියන් සඳහන් කළ හැකිය. නාථ දෙවියන් ලෙස වර්ධනය වීමට ප්‍රථම බෝධිසත්වයකු ලෙස පිදුම් ලැබූ අවධියේ ජනතාව අවලෝකිතේශ්වර වන්දනය තුළින් ලෞකික හා ලෝකෝත්තර යනුවෙන් අපේක්ෂා දෙකක් සාක්ෂාත් කරගැනීමට උත්සාහ කළෝය.[22] එහි ලෞකික පාර්ශවය ඉස්මතු වීම තුළින් නාථ දේව සංකල්පය බිහි විය.

දේශීය දේව ධූරාවලියේ බුදුන් වහන්සේට ප්‍රධාන ස්ථානයක් ලබා දී ඇත. පැරණි යුගයේ දක්නට ලැබුණු දේව විශ්වාස හා සසඳන විට වර්තමානයේ එම විශ්වාසයන්ගේ විවිධ වෙනස්වීම් දක්නට ලැබේ. වර්තමාන සමාජය තුළ දෙවිවරුන් පිළිබඳ විශ්වාසය හීන වී ගොස් තිබීම එම වෙනස්කම් අතර ප්‍රධාන වෙනසක් ලෙස දැක්විය හැකිය. නූතනයේ පවතින තාක්ෂණික දියුණුව එයට හේතු වූ බව පැහැදිලිය. එසේම වෛද්‍ය

හා විද්‍යාත්මක පහසුකම් ද මෙම වෙනසට ප්‍රබල හේතුවක් වී ඇත. මේ නිසා අතීතයට වඩා අද අත්භූත බලවේගවල පාලනය කිසියම් ආකාරයක වෙනසක් සිදු වී තිබේ.

නූතන සමාජ ක්‍රමය තුළ මිනිසා පිඩා විඳින්නේ පොදු සමාජ ප්‍රශ්න විසඳාගැනීමට වඩා පෞද්ගලික අරමුණු සාක්ෂාත් කරගැනීම පිණිස ය. සමාජයේ පවතින අසමතුලිතතාව තුළින් පීඩාවට පත් ජනතාව තම අපේක්ෂා මුදුන් පමුණුවා ගැනීමට දෙවියන් කරා යොමුවී තිබේ. ශීඝ්‍රයෙන් නවීකරණය වන සමාජ හා ආර්ථික සන්දර්භය තුළ මිනිසාට විවිධාකාර ගැටලුවලට මුහුණ දීමට සිදුවේ. මෙම ගැටලු මිනිසාට ඔරොත්තු නොදෙන තරම් ය. උද්ගතව ඇති ප්‍රශ්නයට විසඳුම් සෙවීමේ දී යුක්තිය, සධාරණත්වය නිසි පරිදි ඉටුවන්නේ ස්වල්ප දෙනෙකුට පමණි. මෙවන් තත්ත්වයක් යටතේ නොපෙනෙන අදෘශ්‍යමාන බලවේග විකල්ප මාර්ග ලෙස යොදා ගැනීමට සිටින දෙවිවරුන්ට මේ නිසා ඔවුහු විවිධ පුද පූජා පවත්වති.

අයදතන සිංහල බෞද්ධ සමාජයෙහි දේව විශ්වාස පැරණි යුගවල තිබූ දේව විශ්වාසවලින් වෙනස් වන තැන් කිහිපයකි. ප්‍රධානතම වෙනස ලෙස පෙනෙන්නේ අතීතයේ තරම් දෙවිවරුන් ගැන විශ්වාසය නැතිවීමයි. නූතන තාක්ෂණික ඥානය හා නව ශිෂ්ටාචාරයේ විවිධ පහසුකම් තවත් හේතුවකි. එබැවින් දෙවියන්ගේ පිහිටෙන් තොර ව මිනිසුන්ගේ ප්‍රශ්න විසඳාගත හැකිය යන අදහස පවතී. තවද බෞද්ධයා වඩ වඩාත් බුදුන් වහන්සේගේ මූලික දහම් කරුණු කෙරෙහි වැඩි නැඹුරුවීමක් දැක්වීම ද දේව විශ්වාස ජනතාවගෙන් දුරස් ව යාමට හේතුවක් වී ඇත. මෙය ජනප්‍රිය බුදුදහම නිසා ප්‍රචලිත වූ ප්‍රබල මතයක් බවට පත්වී තිබේ. මේ හේතුව නිසා ශීල, සමාදානය, භාවනා, වැනි කටයුතු කෙරෙහි නැඹුරුතාව නිසා දෙවියන් සම්බන්ධ පූජා නොවැදගත් වන තත්ත්වයට පත්ව ඇත. මේ නිසා අතීතයේ පැවති දේව විශ්වාස හා නූතන දේව විශ්වාස අතර වෙනස්කම් දක්නට ලැබෙන බව පැහැදිලිය.

අයදතන සමාජයේ දේව විශ්වාස ප්‍රබල ලෙස පවතින බවත් බෞද්ධයන් බොහෝ දෙනෙකු තම ප්‍රශ්න හමුවේ අවිධිමත් විශ්වාස කරා ළඟාවීමක් ඇති බවත් කරුණු පිරික්සීමේ දී පැහැදිලි වේ. ලංකා සමාජය පිළිබඳව ගවේෂණයක නිරත වූ මහාචාර්ය ගණනාථ ඔබේසේකර වැනි සමාජ විද්‍යාඥයින්ට අනුව මිනිසාගේ ලෞකික අරමුණු හමුවේ දෙවිවරුන් ඇදහීමේ ප්‍රවණතාව වැඩි බව පෙන්වා දේ. [23] සමාජ වෙනස්වීම් තුළින් ඇති වන ගැටලු හමුවේ සමාජ නැඹුරුතාව, විශ්වාස හා බලවේග කරා යොමු වන බව පැහැදිලි කර තිබේ. මෙම ප්‍රවණතා සමාජ, ආර්ථික, දේශපාලන බලවේග හා සම්බන්ධ වන අයුරු දක්නට ලැබේ. අධික ලෙස වර්ධනය වන ජනගහනය සහ සම්බන්ධ ලංකාවේ ප්‍රශ්න මූලික වී ඇත. ඒ තුළින් සිදුවන එක් අනිවාර්ය ප්‍රතිඵලයක් වන්නේ මහා පරිමාණ රැකියා විරහිත බවක් ද ඌන සේවා නියුක්තියක් ද ඇති වීමයි. මේ සඳහා කුමන හේතු බලපාන්නේ ද කියා ඔවුන් දන්නේ නැත. මෙම තත්ත්වය තවතවත් වැඩි දියුණු කරන හේතු වන්නේ බල සංකේන්ද්‍රණයත් දේශපාලන බලය හිතුවක්කාරී ලෙස භාවිත කිරීමත් මත යැයි සිතීමට අවකාශ තිබේ. ප්‍රබල ගැටලු හමුවේ පුද්ගලයා හුදෙකලා ව, වෙන් ව පරපෝෂිත තත්ත්වයට පත්ව ඇත.

මෙම විපර්යාසයන්හි ප්‍රතිඵල වශයෙන් සමකාලීන මනුෂ්‍ය ජිවිතය තුළ විවිධ දුෂ්කරතා පහළ වී තිබේ. අතීතයේ පෙර සඳහන් කළාක් මෙන් සමාන්‍ය දුෂ්කරතා, වසංගත රෝග ආදියට වඩා අද සමාජ ප්‍රශ්න ප්‍රබල ව පවතී. ස්වාමි භාර්යා ගැටලු, දෙමාපිය දූදරු ගැටලු ඉඩම් ආරවුල්, නඩුහබ රැකියාවන්හි දුෂ්කරතා මින් සමහරකි. තවද අධ්‍යාපන පහසුකම් ප්‍රබල ලෙස ව්‍යාප්ත වීම සහ පාලන තන්ත්‍රයේ ප්‍රසාරණය වීමත් සමඟ පුද්ගලයාට ඉටු කර ගත යුතු ආරවුල් උත්සන්න වී ඇත. අපේක්ෂා මට්ටම අතර ක්‍රියා කලාප පදනම් කරගෙන පුද්ගල බලාපොරොත්තු ශූන්‍ය වී පවතී. ලෞකික අපේක්ෂා ඉටුනොවූ කල විකල්ප මාර්ග ලෙස සමාජමය වශයෙන් ක්‍රියාත්මක වන ආකාරය පහත පරිදි වර්ග කර දැක්විය හැකිය.

1. පරාජිත ආකල්පයෙන් යුතුව නිෂ්ක්‍රිය වීම.
2. දේශපාලන සබඳතා මගින් ක්‍රියාත්මක වීම.
3. සමාජ ක්‍රමය වෙනස් කිරීම.
4. නව අරමුණු සාක්සාත් කර ගැනීමට සාම්ප්‍රදායික උපක්‍රම භාවිත කිරීම.[24]

ලෞකික ප්‍රශ්න හා අපේක්ෂා හමුවේ සලකා බලන විට මිනිසාට විධිමත් උපක්‍රම තුළින් ලැබෙන සහනයට වඩා අවිධිමත් ක්‍රම මගින් දෙවියන් වෙත ළඟාවීම සුලබ දෙයකි. දෙවිවරුන් සමස්තයක් ලෙස ගැනීමේ දී විවිධ දෙවිවරුන්ගෙන් විවිධාකාර පිහිට ලැබෙන විශ්වාසයක් සමාජයේ පවතී. නිදසුන් කිහිපයක් දැක්විය හැකිය. අකටයුතු හමුවේ බැතිමත්තු මුන්නේශ්වරම් දේවාලයට රැස්වෙති. මෙය විශේෂයෙන් ම සොරකම්, සතුරුකම් ආදිය හමුවේ දෙස්තියා, පොල් ගසා පඬුරු කපා වින කිරීමට රැස් වන ස්ථානයකි. සීනිගම දේවාලය මගින් සෙත් ශාන්තිය, සමාජ පුද්ගල අභිවෘද්ධිය සාධනය කර දෙන බවට විශ්වාසයක් පවතී. දේශපාලන වාසි අපේක්ෂාවෙන් රත්නපුර,දෙවිනුවර, කතරගම ආදී දේවාලවලට ළඟාවීමට මහජනතාව පුරුදුව සිටිති. නමුත් මා අධ්‍යයනයට භාජනය කළ නාථ දේවාල වන මහනුවර, වේගිරිය, දොඩම්වල, සහ පස්ගම යන නාථ දේවාල තුළින් ජනතා අපේක්ෂා වන්නේ රෝග සුවවීම, භව භෝග සරුවීම, දරුඵල අපේක්ෂාව, විභාග ජයග්‍රහණය කිරීම, විදේශ ගමන් සාර්ථක කරගැනීම, අතුරුදහන් වූවන් සොයා ගැනීම යන කරුණුවලට මුල් තැන ලබාදේ. මේ තුළින් පැහැදිලි වන්නේ ලෞකික අපේක්ෂා හමුවේ දේව පිහිට පැතිමට බොහෝ දෙනෙකු පෙළඹී ඇති බව ය.

අධ්‍යයනයට භාජනය කළ නාථ දේවාලවලට පැමිණෙන බැතිමතුන් සමඟ සිදු කළ සාකච්ඡා තුළින් ගම්‍ය වන්නේ තම ලෞකික අපේක්ෂා නාථ දෙවියන් තුළින් ඉටු කර දෙන බවකි. ඒ ඒ දේවාලයට අයත් ප්‍රාදේශීය ජනතාව පුද පූජා පවත්වමින් ආශිර්වාදය සලසා ගැනීමක් ඉටු කරගත්ත ද බාහිර වශයෙන් මිනිසුන් පැමිණෙන්නේ මද වශයෙන් බව පෙනේ. වර්තමාන

සමාජයේ සංකීර්ණ සමාජ රාමුව තුළ මිනිසාට ක්ෂණික විසඳුම් ලබාදෙන සහ සුබ විහරණය වෙනුවෙන් පෙනී සිටින දෙවිවරුන් අබියසට වැල නොකැඩී පැමිණීමත් දැකගත හැකිය. ඒ අනුව මිනිසාට අවශ්‍ය පෞද්ගලික දියුණුව බව කිවහොත් එය සාවද්‍ය නොවේ. විවෘත සමාජයේ පෙනී සිටීමට සවිමත් බලවේග ආර්ථිකය නිසා ඒ පසුපස බොහෝ දේ ජයග්‍රහණය කළ හැකි නිසා එයට සහාය වන බලවේගය වටා රැස්වීම අනිවාර්‍ය වේ.

අනුරාධපුර අවධියේ සිට ආරම්භ වූ අවලෝකිතේශ්වර නාථ වන්දනය විවිධ අයුරින් විකාශනයට පත්වී මහනුවර ප්‍රදේශයේ වඩාත් ජනප්‍රියත්වයට පත්වූ බව අපි දනිමු. මෙම දෙවියන් ඇදහීම ජනප්‍රිය වූ මුල් අවධියේ සිට ම මහනුවර නාථ දේවාලය හැර (පස්ගම, දොඩම්වල, වේගිරිය) එක ම පරම්පරාවකින් පැවතෙන කපුමහත්වරුන් රාජකාරී කටයුතු ඉටු කිරීමත් දක්නට ලැබේ. අධ්‍යයනයට භාජනය කළ ඇතැම් දේවාලවල පරම්පරා විකාශනය වීමේ දී පිරිමි පාර්ශ්වය නොමැතිකමින් ගැහැනු පාර්ශ්වයේ විවාහය තුළින් බිහි වන මුනුබුරන් ද කපු කටයුතුවල නිරත වීම විශේෂත්වයකි. ඔවුන් දෙවියන් වෙනුවෙන් දැඩි භක්තියකින් හා පක්ෂ පාතිත්වයකින් ස්වකීය රාජකාරී කටයුතු ඉටු කරන බව දැක ගත හැකිය. මෙම දේවාල වෙත නාථ දෙවියන්ගේ ආශිර්වාදය ලබා ගැනීමට පැමිණෙන බැතිමතුන්ට කිසිදු අවස්ථාවක මුදල් පිළිබඳ සඳහන් නොකිරීම ද විශේෂත්වයකි. දෙවියන් වෙනුවෙන් පුද කරන මල් හෝ පළතුරු වට්ටිය මත තබා බැතිමතුන් සිය කැමැත්තෙන් පිළිගන්වන මුදලක් පමණක් ලබා ගැනීම සිරිතක් වශයෙන් පවතී. ගැමි ජනතාව හා පිටිසර බද නාථ දෙවියන් අතර නොබිඳෙන සම්බන්ධතාවක් වර්ධනය වීම මෙයට හේතුවක් වී ඇති බව පැහැදිලිය.

නාථ දෙවියන් හා ජනතාව අතර අන්‍යෝන්‍ය වශයෙන් බැඳීමක් පවතින බව පැහැදලිය. කෘෂිකර්මාන්තය ජීවන වෘත්තිය කර ගත් පස්ගම, දොඩම්වල සහ වේගිරිය ජනතාව නාථ දෙවියන්ගේ ආශිර්වාදය නිරතුරු ව ඔවුන්ට ලැබෙන බව

විශ්වාස කරති. මහනුවර නාථ දේවාලය නාගරික ව පිහිටා ඇති නිසා ස්ථිර බැතිමතුන් ප්‍රමාණයක් දක්නට නොමැත. එදිනෙදා දළදා මාළිගාවට පැමිණෙන පිරිස අතුරින් බහුතරයක් නාථ දේවාලය ඇතුළු සෙසු දේවාලවට යෑම අනිවාර්ය තත්ත්වයකි. එසේ ම ගොවිතැන් කටයුතුවල දී විවිධ බාධාවන් ඉවත් කර දෙන ලෙස ඉල්ලා කන්නලව් කිරීමට ජනතාව පෙළඹී ඇත. විශේෂයෙන් ම දොඩම්වල නාථ දේවාලයේ නියෝජිතයකු සෑම කන්නයක දී ම ආශිර්වාද ලබාගත් නාකොළ රැගෙන කුඹුරට ගොස් පුදිමින් පවතින ගොයමෙහි ගැට ගසනු ලැබේ. ඉන් කුඹුරට දේව ආශිර්වාදය ලැබෙන බවට ගැමියෝ විශ්වාස කරති. පස්ගම දේවාලය කෘෂිකාර්මික කටයුතු සමග සෘජු සම්බන්ධතා පවත්වයි. එය මැනවින් පැහැදිලි වන්නේ නෙළා ගත් පළමු අස්වැන්න දේවාලයේ දේව දානය සැකසීම සඳහා ලබාදීමෙනි.

නූතන සමාජයේ විවිධ පුද්ගලයෝ සමාජ විරෝධී ක්‍රියා උදෙසා ද දෙවියන්ගේ ආශිර්වාදය ලබා ගැනීමට පෙළඹී සිටිති. එවෙනි අවස්ථාවල දී දෙවියන් සතුටු කිරීමට යැයි පවසා විශාල වශයෙන් මුදල් වැය කර සත්ත්ව බිලි පූජා පවත්වනු ලැබේ. මහනුවර ප්‍රදේශයේ නාථ දෙවියන් හා ජනතාව අතර දැඩි ලෙස ජනප්‍රිය වී තිබුණ ද කිසිදු අවස්ථාවක දී එවන් විෂමාචාර කටයුතු සඳහා අනුබල ලබා නොදෙන බව සඳහන් කළ හැකිය. ජනතාවගේ යහපත් සිතුම් පැතුම් සඳහා වැඩි අවධානයක් යොමු කරන මෙම දේවාල අන් අයට විපත් පැමිණවීම සිදු කරන්නේ ඉතා කලාතුරෙකිනි. එහෙත් දොඩම්වල නාථ දේවාලය මගින් යම් බැතිමතකුගේ දේපල සොරා ගැනීමක්, යම් අකටයුත්තක් සිදු කළහොත් දෙවියන් හට දැඩි සේ කන්නලව් කර යදින බවට කපුමහතා විසින් පෙන්වා දෙන ලදී. "බෝසත් දෙවි කෙනෙකු එසේ කරයි ද" යනුවෙන් කරුණු සෙවීමේ දී තහවුරු වන්නේ නාථ දෙවිඳුන්ට එම කාර්යය භාර දී දඬුවම් කිරීම සඳහා දොඩම්වල නාථ දෙවියන්ගේ ආරක්ෂකයා වශයෙන් සැලකෙන දැඩිමුණ්ඩ දෙවියන්ට එම කාර්ය පවරන බවයි. වෙනත් කිසිදු දේවාලයක එවෙනි කාර්ය පැවරීමක් සිදු වන්නේ ද නැත.

වර්තමානය වන විට නාථ දෙවියන් හා බෞද්ධාගම අතර, දැඩි සමීප සබඳතාවක් ගොඩනැගී පවතී. ඊට ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ අනාගතයේ මතු බුදු බව ලබා ගැනීමට විවරණ ලබා ඇත්තේ නාථ දෙවියන් නිසා ය. බෞද්ධ ජන සමාජයෙහි කවර හෝ ආගමික කාර්යයක් අවසානයේ දී පින් අනුමෝදන් කිරීමේ දී ප්‍රාර්ථනා කරන්නේ අනාගතයේ මතු බුදුවන නාථ දෙවියන් හෙවත් මෛත්‍රී බුදුන් හමුවේ දහම් අසා නිවන් සාක්සාත් කර ගැනීමයි.

අධ්‍යයනයට බඳුන් කළ නාථ දේවාලයෙහි දෙවියන් වෙනුවෙන් කරන සෑම කටයුත්තක දී ම තෙරුවන් වැඳ පන්සිල් සමාදන් වී එම කාර්යය ආරම්භ කිරීම සුවිශේෂී ලක්ෂණයකි. එසේ ම මංගලාෂ්ටක ගායනා කර බුදු ගුණ සිහිපත් කර යාතිකාව පටන් ගැනීම අතීතයේ සිට පැවති සිරිතක් වේ. බුදුදහම හා නාථ දෙවියන් අතර පවතින අන්‍යෝන්‍ය සම්බන්ධතාව පර්යේෂණයට භාජනය කළ දේවාල භූමියේ දක්නට ලැබෙන බෝධීන් වහන්සේ හා බුදු මැදුර තුළින් මනා ව පැහැදිලි වේ. දෙවියන්ගේ පිහිට අපේක්ෂාවෙන් පැමිණෙන බැතිමතුන් බොහෝ දෙනෙක් මෙම බෝධීන් වහන්සේ හෝ බුදු මැදුර අබියසින් බුදුරජාණන් වහන්සේ වෙනුවෙන් මල් පහන් පූජා කොට වන්දනා මාන කිරීම අනිවාර්ය චාරිත්‍රයකි. එසේ ම නාථ දෙවියන් විෂයෙහි පවත්වන ප්‍රධාන දේව මංගල්‍යයේ දී පූජා කටයුතු ආරම්භ කරන්නේ බුදුන් පුදාය. බෞද්ධයන්ගේ ඇදහිලි හා සම්බන්ධ දේව දූරාවලිය ද මෙයට එක් හේතුවක් වන බව පැහැදලිය. වර්තාමානයේ බුද දහම තුළ නාථ දේව වන්දනයට විශේෂ ස්ථානයක් පවතින බවට ප්‍රකාශ කළ හැකිය.

## ආන්තික සටහන්

1 ධර්මදාස, කේ.එන්.ඕ. සහ තුන්දෙණිය, එච්.එම්.එච්, සිංහල දේව පුරාණය, පිටු. 76.

2 පරණවිතාන, සෙනරත් "ලක්දිව මහායානවාදය," පුරාණ යුගය, පිටු. 189.

3 හේරත්, යමුනා, ශ්‍රී ලංකාවේ බෞද්ධ ප්‍රතිමා හා රූකම්, පිටු. 204.

4 හෝල්ට්, ජෝන්, ක්ලිෆර්ඩ්, මකුට මුනිධාරි අවලෝකිතේශ්වරනාථ ලංකා පුරාණය, පිටු. 137.

5 චන්ද්‍රසිරි, නියනගේ, ලක්දිව අභිෂේක මංගල්‍යය, පිටු. 164.

6 පූජාවලිය, සංස්. කිරිඇල්ලේ ඤාණවිමල, ගුණසේන සහ සමාගම, කොළඹ. 1986, පිටු. 698.

7 මහාවංසය, පරි. 87, ගාථා 3 -9.

8 E.Z Vol. IV P. 90 -110.

9 ඉලංගසිංහ, මංගල, මධ්‍යකාලීන ලංකාවේ ආගම, පිටු. 270-280.

10 E.Z. Vol. IV P. 296 -311.

11 හෝල්ට්, ජෝන් ණී ක්ලිෆර්ඩ්, මකුට මුනිධාරී අවලෝකිතේශ්වර නාථ ලංකා පුරාණය, පිටු. 153.

12 E.Z. Vol. IV, P. 271 -273.

13 හෝල්ට්, ජෝන්, ක්ලිෆර්ඩ්, මකුටමුනිධාරි අවලෝකිතේශ්වර ලංකා නාථ පුරාණය, පිටු. 66,

14 එම, පිටු. 67.

15 තිසර සංදේශය, කවි. 126.

16 කෝට්ටේ යුගයේ සංදේශ තුළින් නිරූපිත නාථ දෙවියන් මාතෘකාව බලන්න.

17 බෝගොඩ, සීලවිමල, බෞද්ධ ප්‍රතිමාඝරයට පිවිසි හින්දු දෙවියෝ, පිටු. 256.

18 ධර්මදාස. කේ.එන්. ඕ. "ලක්දිව බුදුසමයෙහි බෝධිසත්ව. දේව සංකල්පය", සංස්කෘත ලිපි සංග්‍රහය. නිශ්ශංක පෙරේරා සහ තවත් අය, පිටු. 95.

19 ධර්මදාස, කේ.එන්.ඕ. හා තුන්දේණිය එච්.එම්. එස්. සිංහල දේව පුරාණය, පිටු. 79.

20 පරණවිතාන, සෙනරත්, 'ලක්දිව මහායානවාදය', පුරාණ යුගය, පිටු. 193.

21 Davy, John, an Account of the Interior of Ceylon and Inhabitomts, London, 1821.p. 64.

22 ධර්මදාස, කේ.එන්.ඕ. සහ තුන්දෙණිය, එච්.එච්.එස්. සිංහල දේව පුරාණය, පිටු. 91.

23 **Gombrinh , Richard and Obesekera, Gananath, Buddhism trans formed religions change in Sri Lanka,P.8.**

24 ධර්මදාස, කේ.එන්.ඕ. සහ තුන්දෙණිය, එච්.එච්.එස්. සිංහල දේව පුරාණය, පිටු. 37-40.